පුනරීක්ෂණ අභ්‍යාස

1.

ඔබ විද්‍යාලයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රධානෝත්සවය ලබන මස දිනක පැවැත්වීමට තීරණය කර තිබේ. පරිසරයට මුල් තැන දෙමින් උත්සවයේ සියලුම සැරසිලි කටයුතු කිරීමට සංවිධායක මණ්ඩලය තීරණය කර තිබුණි.

i. විද්‍යාලයේ පිවිසුම් දොරටුවේ සාදන තොරණ සඳහා යොදාගත හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 04 ක් ලියන්න.

ii. තොරණ නිර්මාණය කිරීමට සුදුසු දළ රූපසටහනක් ඇඳින්න.

iii. උත්සව ශාලාව ස්වභාවික මල්වලින් අලංකාර කිරීමට සුදුසු ස්ථාන 02 ක් නම් කරන්න.

iv. උත්සව ශාලාවේ තැනින් තැන ජ්‍යාමිතික හැඩ සහිත පාපිසි තැබීමට තීරණය කරන ලදී. ඒ සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල 04 ක් අඳින්න.

v. බිත්ති සැරසිලි සඳහා ස්වභාවික ශාක පත්‍ර භාවිතයෙන් කළ නිර්මාණ තැබීමට යෝජිතය. ඒ සඳහා සුදුසු වියමන් රටා දෙක මතුපිට පෙනුම අඳින්න.

vi. උත්සව ශාලාවේ වේදිකාව දෙපස මැටි මාධ්‍ය යොදා ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතයෙන් අලංකාර කළ පුන්කලස් 02 ක් තැබීමට තීරණය කරන ලදී. අලංකාර කරන ලද පුන් කළස් දෙකක රූප සටහන් අඳින්න.

vii. ඉහත ඔබ අඳින ලද පුන්කළස් දෙක අලංකාර කිරීමට යොදාගත හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 04 නම් කරන්න.

viii. උත්සව ශාලාවේ තැබීමට සුදුසු උද්‍යාන අලංකරණ නිර්මාණ 02 ක් නම් කරන්න.

ix. ඉහත ඔබ නම් කළ උද්‍යාන අලංකරණ නිර්මාණවලට යොදා ගෙන තිබූ ස්වභාවික අමුද්‍රව්‍ය 02 ක් නම් කරන්න.

x. තෑගි තබන සිසුන්ට සිහිවටනයක් ලෙසින් බෑගයක් ප්‍රදානය කිරීමට නියමිතය. බෑගයට සුදුසු ජ්‍යාමිතික හැඩති ආකෘතියක් නිර්මාණය කරන්න.